# මාධ්‍ය නිවේදනය

## සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලයෙහි මහ ලේකම් තනතුරට පත් කිරීම

අග්‍රාමාත්‍යවරයා විසින් සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලයේ මහ ලේකම්වරයා ලෙස මනෝ තිත්තවැල්ල මහතා පත්කරන ලදි. තිත්තවැල්ල මහතා රාජ්‍ය හා පෞද්ගලික අංශයට අයත් විවිධ ආයතන වල ඉහළ මට්ටමේ නායකත්ව තනතුරු හෙබවීමෙන් ලත් විශිෂ්ඨ සේවා වාර්තාවක් සහිත වූවෙකි.

තිත්තවැල්ල මහතා රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙසත්, උපායමාර්ගික ව්‍යාපාර කළමණාකරණ ආයතනයෙහි සභාපතිවරයා ලෙසත්, ජාතිය යළි ගොඩනැගීමේ කාර්ය බලකායේ සභාපතිවරයා ලෙසත්, ජනාධිපති කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ ජ්‍යෙෂ්ඨ ජනාධිපති උපදේශකවරයෙකු ලෙසත් කටයුතු කර ඇත. ඔහු කදිරගාමර් ආයතනයේ කළමණාකාරීත්ව මණ්ඩලයේ සාමාජිකයෙකුද වේ.

තිත්තවැල්ල මහතා වර්තමානය වන විට ප්‍රධාන පෙළේ සමූහ ව්‍යාපාරයක් වන ඊ.ඒ.පී හෝල්ඩින්ස් හි සභාපති මෙන්ම කළමණාකරණ අධ්‍යක්ෂකවරයා වශයෙන් කටයුතු කරන අතර ලංකා සෙකියුරිටීස්හි ප්‍රධාන විධායක නිලධාරීවරයා ලෙසත් ශ්‍රී ලංකා ජාඩින් ෆ්ලෙමින් සෙකියුරිටීස් හි පර්යේෂණ ප්‍රධානී ලෙසත් කලක් සේවය කොට ඇත.

ඒ මහතා එඩින්බර්ග් විශ්ව විද්‍යාලයේ ප්‍රාග්ධන වෙළඳපොළ සහ මූල්‍ය කටයුතු පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිලාභියෙකි. තවද ඒ මහතා එක්සත් ජනපදයේ අලෙවිකරණය පිළිබඳ වරලත් ආයතනයේ සාමාජිකයෙකුද වෙයි.

------

සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය

www.scrm.gov.lk

ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 1, ශ්‍රී ලංකාව
குடியரசுக் கட்டடம், கொழும்பு 1, இலங்கை
The Republic Building, Colombo 01, Sri Lanka
දුරකථන / தொலைபேசி /Phone : +94115920029
ඊ මේල් /மின்அஞ்சல்/Email : contact@scrm.gov.lk